බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
**External Degrees and Extension Courses Unit**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
**University of Sri Jayewardenepura**


මගේ අංකය / My Number: USJP/BA/EEX-15
ඔබේ අංකය / Your Number:
දුරකථනය / Telephone: 011-2801481, 011-3132496, 011-2758233
ෆැක්ස් / Fax: 011-2802753
ලිපිනය / Address: තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල, Post Box 10, Gangodawila, නුගේගොඩ, ශ්‍රී ලංකා, Nugegoda, Sri Lanka ,
වෙබ් අඩවිය / Website: www.external.sjp.ac.lk
විද්‍යුත් තැපෑල / E-mail: ext.certi@sjp.ac.lk


2022.08.02

ගරු ස්වාමින් වහන්ස/ මහත්මයාණෙනි/ මහත්මියනි/ මෙනවියනි

**2020 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව - පාඨමාලා ගාස්තු දෙවන වාරිකය හා තෙවන වාරිකය**

උක්ත උපාධි පාඨමාලාවේ වාරික ගෙවීම් සම්බන්ධයෙන් ඔබ විසින් ඉදිරිපත් කළ ඉල්ලීම්වලට අනුව 58 වන මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා අධ්‍යයන මණ්ඩලයේ තීරණය කළ පරිදි ඔබ විසින් පාඨමාලා ගාස්තු දෙවන වාරිකය සහ තෙවන වාරිකය ගෙවීම් කළ යුතු දිනයන් දීර්ඝ කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

2020 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි I පරීක්ෂණය පැවැත්වීමට අදාළ අයදුම්පත් කැඳවීමේදී ඒ සඳහා අයදුම් කිරීමට ඔබ විසින් මෙම ගෙවීම් සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම විභාග ප්‍රවේශපත් නිකුත් කරනු ලබන්නේ වාරික 02කම ගෙවා සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්ට පමණක් බව වැඩිදුරටත් දන්වා සිටිමි.

| | |
|---|---|
| **පාඨමාලා ගාස්තු දෙවන හා තෙවන වාරික ගෙවිය යුතු ගිණුම් අංක** | දෙවන හා තෙවන වාරික සඳහා වෙන වෙනම ගිණුම් අංක ලබා ගත යුතු අතර **www.external.sjp.ac.lk** යන වෙබ් අඩවියට පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය "v" අකුර රහිතව යෙදීමෙන් බාගත (Download) කර ගත හැක. |
| **පාඨමාලා ගාස්තු**<br>**දෙවන වාරිකය**<br><br>**දෙවන වාරිකය** සඳහා මුදල් ගෙවිය යුතු අවසන් දිනය | රු. **30,000.00**<br><br>**2022.08.31 දක්වා දීර්ඝ කර ඇත.** |
| **පාඨමාලා ගාස්තු**<br>**තෙවන වාරිකය**<br><br>**තෙවන වාරිකය** සඳහා මුදල් ගෙවිය යුතු අවසන් දිනය | රු. **30,000.00**<br><br>**2022.08.31 දක්වා දීර්ඝ කර ඇත.** |
| **අයදුම්පත් යොමු කළ යුතු ආකාරය** | සම්පූර්ණ කරන ලද අයදුම්පත හා රිසිට්පත්වල පැහැදිලි පිටපත් (Scanned Copy) අදාළ දිනට පෙර reg.edecu@sjp.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතුය. (අදාළ ලේඛන විද්‍යුත් ලිපිනයට යොමු කිරීමේදී **2020 BA (General) External Degree – 2nd Installment / 3rd installment – Reg. No** (ඔබගේ ලියාපදිංචි අංකය) ලෙස සඳහන් කර එවීම අනිවාර්ය වේ.) |

**ඔබගේ විශේෂ අවධානයට:**

1. පාඨමාලා ගාස්තු ගෙවීම සඳහා එක් අයදුම්කරුවකු වෙනුවෙන් සුවිශේෂී ගිණුම් අංකයක් ඇති අතර අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කළ යුතුය. **වෙනත් ගිණුම් අංකවලට ගෙවනු ලබන මුදල් පිළිබඳ විශ්වවිද්‍යාලය විසින් වගකියනු නොලබන බව කරුණාවෙන් සළකන්න. (එහි ඡායාපිටපතක් ළග තබා ගත යුතුය).**

2. **විද්‍යුත් තැපැල් ලිපිනයට ප්‍රමාදවී ලැබෙන අයදුම්පත්, නියමිත පරිදි මුදල් නොගෙවන ලද අයදුම්පත්, අසම්පුර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව විශ්වවිද්‍යාලය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**



නියෝජ්‍ය ලේඛකාධිකාරි

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය